# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## 2022 - පෙරහුරු පරීක්ෂණය
## 11 ශ්‍රේණිය - අ.පො.ස.(සා.පෙළ) විභාගය
## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි.**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**
**අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර සොයන්න.**
**ඔබට සැපයෙන උත්තර පත්‍රය එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
**එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න. කාලය පැය 01 යි**

1 සිට 3 දක්වා ඇති ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

01. නැන්දාගේ **තොරතෝංචියක්** නැති කතාව මාමාට එපා විය.
   1. ප්‍රමාදයක්
   2. චාතුර්යයක්
   3. ශිෂ්ටත්වයක්
   4. නැවතීමක්

02. අක්කාගේ නොමනා ක්‍රියා නිසා තමන්ගේ **මූණේ දැලි** ගෑවෙන බව අම්මා නිතර කී වදනකි.
   1. අපකීර්තියට පත් වීම
   2. අපහසුතාවයට පත් වීම
   3. කෝපයට පත් වීම
   4. අවලස්සන වීම

03. **අතපල්ලෙන් වැටුණු** දරුවෙක් සේ සලකා ඔහු ගැන කතා බහ කිරීම අනුමත කළ හැකි ද?
   1. පිරිසෙන් කොන් වූ
   2. අත්පා දුබල
   3. කාත් කවුරුත් නැති
   4. අතපය නොසොල්වන

අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. ඒ ඒ චරිත ලවාම එකී චරිතවල සිතුවිලි ........................... අනාවරණය කිරීම විඥාන ධාරා රීතියයි.
   1. සමස්තය
   2. සමුච්චය
   3. සමුදාය
   4. සංඛ්‍යාව

05. නිර්මාණකරුවා තමා අත්දුටු දෙය ඒ ආකාරයෙන් ම නොව සිතින් මවාගත් කොටසක් ඊට එක් කිරීම ....................... ය.
   1. චිත්තරූප
   2. මනඃකල්පිත
   3. පරිකල්පනය
   4. ප්‍රතිභාව

06. සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ..................... කිරීමට සිසුන් යොමු කිරීම වැදගත් බව විද්වත්හු අවධාරණය කරති.
   1. පරිහරණය
   2. පරිශීලනය
   3. පරිග්‍රහණය
   4. පරිභාවිතය

07. අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. තෝලංගමුව, දුනුගමුව, වස්ගමුව, විල්ගමුව
   2. කෑගල්ල, අඹේපුස්ස, මාතලේ, පැල්පොළ
   3. මාලන්, සරත්, අනුර, විජය
   4. මධ්‍යසාර, විමර්ශන, මර්දනය, ප්‍රතිඵලය

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. නර්ථන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය
2. ශ්‍රව්‍ය ගෝචර, චෛත්‍යය, ඖෂධ, විශේශන
3. ප්‍රතිඵල, සූක්ෂම, නෛයිතික, විද්‍යාඥ
4. ප්‍රස්තාරය, ශිෂ්ටාචාරය, දෘෂ්ටිය, අලුයම

09. එක් එක් වචනයේ මුල් අකුරේ ඉස්පිල්ල, රකාරාංශය, පාපිල්ල, ඇදය අනුපිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. සිහින, ප්‍රජාව, රුපියල, පැහැදිලි
2. සිරිමත්, ප්‍රතිලාභ, රූහැන, නැටිලි
3. නිකිණි, පුරහන, කුමරිය, තියුණු
4. විලාසය, නුපුහුණු, ප්‍රබල, රුහුණු

10. මලවි යන්න අයත් වන්නේ,

1. විභක්ති සමාසයට
2. විශේෂණ සමාසයට
3. අන්‍යාර්ථ සමාසයට
4. අව්‍ය සමාසයට

11. උක්ත නාම පද දෙකක් ඇති පිළිතුර තොරන්න.

1. සිංහයා, ගැහැණියක්, ළමයි, මම
2. අපි, තෝ, දැරියක, සේවකයෙක්
3. බමුණෝ, රීතීන්, ඔවුහු, ක්‍රීඩකයෙකු
4. ගුරුවරුන්, ධාවකයෙකු, දෙවඟනක, ශිෂ්‍යාවක

12. 'ජනපද + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍ය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

1. ජනාපදික
2. ජානපදික
3. ජානාපදික
4. ජෛනපදික

13. "ගුරුවරු දරුවන්ට අකුරු උගන්වති." මෙහි දරුවන්ට යන්නෙහි විභක්තිය

1. සම්බන්ධ
2. ආධාර
3. අවධි
4. සම්ප්‍රදාන

14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටස අර්ථය නිවැරදිව දක්වන්න.

14. **විදග්ධ** කවීහු අපූර්ව නිර්මාණ කරති.

1. විශේෂ
2. වියත්
3. විදේශ
4. ප්‍රකට

15. ප්‍රාකාර ආදියෙන් පරික්ෂිප්ත වූ අඹ උයනක් ද තිබිණි.

1. වටවූ
2. සරසන ලද
3. පිරිසිදු වූ
4. පිරිහුණු

16. යම් කරුණක් **ප්‍රත්‍යක්ෂ** වනතුරු ම අධ්‍යයනය කළ යුතුය.

1. දියුණුවන
2. ලැබෙන
3. පසක්වනතුරුම
4. ඇගයීමට ලක්වන

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.

1. නිපාත - සමඟ, හෙවත්, ද , ඉක්බිති
2. උපසර්ග - අවංක, සුසුදු, ප්‍රබල, අබිමන්
3. තද්ධිත - රන්මය, බලවත්, සිඟිති, වකුටු
4. සන්ධි - දකුණත, වමැස, කුකුස, දිගැස

18. අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

1. අඹ, රඹුටන්, පේර, මාදං
2. රතු, සුදු, නිල්, සල්
3. තද්ධිත, කෘදන්ත, නිපාත, උපසර්ග
4. මුල්, කඳ, අතු, ගෙඩි

19. සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. විකසිත, මුක්ත, වුල්ල, මුකුලිත
2. කාන්තාව, ස්ත්‍රිය, වනිතාව, ළඳ
3. කනක, රන්, ස්වර්ණ, රජත
4. සටන, යුධ, තරඟ, රථ

20. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වන්නේ,

1. ගජ - ඇත් , නා, හස්ති, ශක්ති
2. කුඹුර - වෙල, ඉස්සර, කොඹර, ලියද්ද
3. නෙළුම් මල - පද්ම , සියපත, පංකජ, කමල්
4. පියා - පීතෘ, පිතු , තාත්තා, අප්පච්චි

21. විරුද්ධාර්ථවත් පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

1. කුලීන - කුලහීන
2. දුෂ්කර - සුකර
3. අනුමාන - ප්‍රත්‍යය
4. පුරෝගාමී - අනුගාමී

22. “අම්මා උදේ ම නැගිට තේ සූදානම් කරමින් සිටිද්දී තාත්තා කතා කළේය.” මෙම වාක්‍යයේ ක්‍රියාපද යෙදී ඇති අනුපිළිවෙළ වන්නේ,

1. පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
3. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා

23. වැරදි අදහස දෙන පිළිතුර තෝරන්න.

1. ධනවත් යනු තද්ධිත පදයකි.
2. අවවාද යන්නෙහි “අව” යනු කෘදන්තයකි.
3. “පොල්ලත්ත” ද්විත්ව රූප සන්ධියට උදාහරණයකි.
4. අනුන් විසින් මෙහෙයවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාවයි.

24. ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට උදාහරණයක් වන්නේ,

1. කොළොම්තොට
2. වල්ලූරා
3. ලිග්ගල
4. පුනර්භවය

25. අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය වන්නේ,

1. ම ලි ග ර ම ය
2. ජා ව න ය දු ලි
3. ර ත් ඹු ස ය ණි
4. ර ව තු මා අ

අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. හොඳට හොඳ එකතු වීම.

1. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ
2. සඳුන් ගහට සමන් වැලක් ගියා වගේ
3. වක්කඩේ හකුරු හැංගුවා වගේ
4. ගින්නට පිදුරු දැම්මා වගේ

27. උදව් බලාපොරොත්තු වූ විට නරකක් සිදු වීම

1. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වගේ
2. ඉඟුරු දී මිරිස් ගත්තා වගේ
3. වඳින්න ගිය දේවාලේ ඉහේ කඩන් වැටුණා වගේ
4. අටුවෙන් දූමට වැටුණා වගේ

අංක 28-30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

28. 1. ගස් පෙළ සුළඟින් සෙලවෙති.
2. සභා තොමෝ සතුටින් විසිර ගියහ.
3. පුතණුවෝ දෙමාපියන්ට ගරු කරති.
4. මව නොහොත් පියා දරුවන්ට අවවාද දුන්නෝ ය.

29. 1. මුවෝ වතුර බොද්දී කොටියෙක් කඩා පැන්නෝය.
2. මුවෙක් වතුර බොද්දී කොටියෙක් කඩා පැන්නේය.
3. මුවන් වතුර බොද්දී කොටියෙක් කඩා පැන්නේය.
4. මුවන් වතුර බොද්දී කොටියෙකු කඩා පැන්නේය.

30. 1. බොහෝ ශිෂ්‍යයෝ දක්ෂයෝ ලූ
2. ඔවුන් අවංක පුද්ගලයෝ ද?
3. ඔවුහු අපට දේවි
4. ශිෂ්‍යයෝ පන්තියට පැමිණ නැත.

පද දෙක ම සමාන යුගල පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

31. 1. හරකාබාන - ඔප්පු තිරප්පු - ගෙවල් දොරවල්
2. එහෙ මෙහෙ - උඩ යට - ඔබ මොබ
3. අබල දූබල - නරි නාටක - ගේදොර
4. කෙළි සෙල්ලම් - යාන වාහන - හට්ටි මුට්ටි

32. "වැල්ලම්පිටිය" යන පදය නිවැරදි ව විසන්ධි කර ඇති පිළිතුර තෝරන්න.
1. වැල් + අම්පිටිය
2. වැලි + අම්පිටිය
3. වැල්ල + අම්පිටිය
4. වැල් + ලම්පිටිය

33. "වැඳ රද පද කමල" යන පාඨයෙහි ඇති අලංකාර දෙකක් වන්නේ,
1. ධ්වනිථාර්ථය - රූපක
2. අනුප්‍රාසය - උපමා
3. අනුප්‍රාසය - රූපක
4. ව්‍යංගාර්ථය - ස්වභාවොක්තිය

34. "බලති" යන ක්‍රියා පදයේ "බල" යනු,

2. ප්‍රත්‍යයකි.
2. ධාතු ප්‍රකෘතියකි.
3. විධි ක්‍රියාවකි.
4. ශබ්ද ප්‍රකෘතියකි.

35. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"එයාලා තරගය දිනයි කියලා අපි හිතුවා"
(1) එයාලා තරගය දිනයි කියලා අපි සිතුමු
(2) ඔවුන් තරගය ජයග්‍රහණය කරති'යි අපි සිතුමු
(3) මොවුන් තරගය දිනති'යි අප සිතුහ.
(4) ඔවුහු තරගය ජයග්‍රහණය කරති'යි අපි සිතුමු.

පහත කවියේ දෙවැනි පදය සඳහා වන පිළිතුර තෝරන්න.

36. වෛර වීරිය ඇතත් සිතේ
.................................................
දහදිය නොම හැලෙන ගතේ
ඔබ පොළවට බරකි පුතේ

1. දෑ උරුමය ඇතිව ගතේ
2. පියකරු බව ඇතත් වතේ
3. ඉදි කළ බැව් බලෙන් පුතේ
4. මව්බිම දෙස බලන් පුතේ

37. "යසෝමා හා විමල්" යන චරිත ඇති කෙටි කතාව තෝරන්න.
1. තොරොක්කෝව
2. වතුර මල
3. මං තනන්නෝ
4. දියමන්ති මාලය

38. පහත කවියෙන් කියවෙන්නේ කුමක් ගැනද ?

කමතේ කෙතේ හේනේ තනියට ඉන්නේ
තුසිතේ ඇතේ යන සොම්නස ගෙන දෙන්නේ
දෙනෙතේ සිතේ අමුතුම දේ අන්දන්නේ
වියපත් සෙනේ සම කවියා බව දන්නේ

1. කෘෂිකර්මාන්තය ගැන
2. විපතක් ගැන
3. සොම්නසක් ගැන
4. කවියා ගැන

39. වට්ටක්කා යන්න පුහුල් ලෙස හැඳින්වෙන්නේ,
1. රුහුණේ
2. මොණරාගල
3. රජරට
4. උඩරට

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

පෘතුගීසි , ලන්දේසි , ඉංග්‍රීසි ආදීන්ගේ ආක්‍රමණ හේතුවෙන් ලංකාවේ සමාජ, දේශපාලන , ආර්ථික, අංගයන්හි වෙනස්කම් රැසක් ඇතිවිය.

1. ලංකාවේ සමාජ, දේශපාලන වෙනස්කම් ඇති වූයේ පෘතුගීසි හා ලන්දේසි නිසාය.
2. ලංකාවේ සියලුම දේ වෙනස් කිරීමට බටහිර ජාතීන්ට හැකි විය.
3. බටහිර ආක්‍රමණ නිසා ලංකා සමාජයට දැඩි බලපෑම් එල්ල විය.
4. බටහිර ජාතීන් නිසා ලංකාව දියුණු විය.

*

**සැලකිය යුතුයි.**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.** කාලය : පැය 02 යි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.

i. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියා දක්වන්න.
(අ) වනය
(ආ) වණය

ii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
අපරාධ මර්ධනය සඳහා රජය ගත් ක්‍රියාමාර්ග මහජනතාවගේ නීරීක්ෂනයට භාජනය විය.

iii. පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ග නම් කරන්න.
(අ) අන්න **බලන්** සඳ රන්තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා
(ආ) මග රැඳුණ අද තෝ **නසී** - ගෙට ගිය අඹුව නසී

iv. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) නැගෙනහිර හා දකුණ අතර ඇති අනුදිශාව
(ආ) හැමදා සිහිකටයුතු වූ

v. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
සිංහල කාව්‍යයේ අභ්‍යුදය සඳහා ඔහු කළ මෙහෙයට කාගේත් ප්‍රශංසාව පිරිනැමිණි.

vi. පහත දැක්වෙන පද සන්ධි කොට ලියා සන්ධි වර්ග නම් කරන්න.
(අ) අති + අවශ්‍ය
(ආ) සුරු + අත

vii. පහත සඳහන් පද්‍ය පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
බලයුත් **තුමුල මත වරණිඳු** මෙදෙනැ විස

viii. පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) මගේ නැන්දා දක්ෂ කිවිඳියක් මෙන් ම ගායිකාවක් ද වන්නීය.
(ආ) වවන්නෝ ජයග්‍රහණය කරති' යි ගුරුතුමා ශිෂ්‍යයන්ට පැවසීය.

ix. පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.
(අ) පැදි කාව්‍යය
(ආ) මනුෂ්‍ය ගුණදම්

x. පහත දැක්වෙන යෙදුම් සඳහා ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
(අ) මසුන් මැරීම
(ආ) දැල් අදින පුද්ගලයෝ

02. පහත දැක්වෙන (අ) , (ආ), (ඉ), (ඊ) යන විස්තරය අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) 'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' යන්න කියවීමේ වටිනාකම පිළිබිඹු කෙරෙන ප්‍රකට යෙදුමකි. එහෙත් රූපවාහිනිය, ජංගම දුරකථනය හා අන්තර්ජාලය වැනි නවීන විද්‍යුත් මාධ්‍ය භාවිතය නිසා පාසල් සිසුන්ගේ කියවීමේ පුරුද්ද ශීඝ්‍රයෙන් පහළ බැස ඇති බවට මත පළ වී ඇත. පාසල් සිසුන් ගේ කියවීමේ රුචිය වර්ධනය කළ හැකි උපාය හා ක්‍රම පිළිබඳව වගකිව යුත්තන් ගේ අවධානය යොමු විය යුතුය.

(ආ) අපේ සාම්ප්‍රදායික ආහාර රටාව අද ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතී. කොස්, දෙල්, අල, බතල, උඳු, මුං, කුරක්කන් වැනි ශක්ති ජනක දේශීය ආහාර පසෙක ලා, අද අපි ඇස දිව පිනවන කෘතිම, පහසු ආහාරවලට නැඹුරුවෙමින් සිටිමු. රටක් වශයෙන් ගත් කල මෙහි අනාගත ප්‍රතිඵලය එතරම් හිතකර විය නොහැකිය.

(ඉ) සිංහල ජන කවිය ගසට පොත්ත මෙන් ජන ජීවිතය හා බැඳී ඇත. එය වසර දෙදහස් ගණනාවකට වැඩි සිංහල සංස්කෘතියේ වාම් බව හා අව්‍යාජත්වය මේ යැයි කියාපාන කැඩපතකි. අපගේ ගැමි ජීවිතයේ ජීවන රටා, සිතුම් පැතුම් හා ගති පැවතුම් සියල්ලක් ම එහි පිළිබිඹු වේ.

(ඊ) සති අන්ත නිවාඩු දින විවේක හා විනෝදය පිණිස මිතුරු කැළ සමඟ කතිකා කරගත් පරිදි දිය ඇල්ලක් බැලීමට පිටත් වීමු. සිංහරාජ අඩවිය තුළ පිහිටි එය නමින් දූවිලි ඇල්ල විය. ගමන් මාර්ගය තරමක් දුෂ්කර වීම නිසා ඇල්ල වෙත ළඟා වීම එතරම් පහසු කටයුත්තක් නොවූ අතර, මධ්‍යාහ්නය ආසන්න වන විට අපි ගමනේ කෙළවරට ළඟා වීමු. එකා පසුපස එකා ලෙස සීරුවෙන් ඇල්ල වෙත සමීප වෙමින් සිටි මට ඉදිරිපසින් ඇසුනේ කිසිවෙකුගේ කෑ ගැසීමකි....... කතාව ගොඩ නගන්න.

(ලකුණු 25යි)

03. පහත දැක්වෙන පාඨය වචන 50 – 55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

භාෂාව යනු මිනිසා තම දීර්ඝ කාලීන ජීවන අරගල සන්තතිය තුළ දී තමා ලත් දැනුම, කුසලතා , ධාරිතා, වින්දන යනාදිය නිදන් කර තැබීමටත්, අන්‍යයන්ට සන්නිවේදනය කිරීමටත් තනාගත් උපකරණයක් බව සුචරිත ගම්ලත්හු ප්‍රකාශ කරති. බස මනා කොට යෙදූ කල්හි සිතූ පැතූ සම්පත් දෙන සුරභි ධේනුවක් වන්නේය. එයම නොමනා ලෙස යෙදූ කල්හි එසේ යොදන්නා ගේ ගොන්කම කියා පාන බැව් කාව්‍යාදර්ශයත් සියබස්ලකරත් පෙන්වා දෙයි. අපට සුබස් මිණි ආරක් ඇත්තේ ය. සුබස් යනු යහබස් ය. යහබස් යනු අරුතින් සරු රසයෙන් පිරි නැණ නුවණ ගැබ් වූ වැඩදායක පද, වාක්‍ය, ජේද, පද්‍ය යනාදිය යි. මිණි නම් මැණික් ය. ආර යනු ආකරය යි. අපට ඇත්තේ එවන් බස් මිණි ආකරයකි. කුමාරතුංගයන් පළ කරන පරිදි මේ තුන් ලෝකයේ පවතින වටිනා ම රත්න තුන මිහිරි ජලය, රස අහර, සුබස් ආදිය බව ය. මෝඩ ජනයා කරුණු කාරණා නොදන්න නිසා ගල් කැබලි වටිනා මැණික් ලෙස හඳුන්වති. ගුණවත් අධ්‍යාපනයකින් සිදුවිය යුත්තේ සංරක්ෂණය කොටගත යුතු අප සුබස් රත්නය ගල් කැබලි ලෙස හැඳින්වීමට ඉදිරි පරපුරට අවකාශ නොසැලසීම ය.

(ලකුණු 10)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

තොටගමුවේ සිරි විජයබාහු පිරුවන කෝට්ටේ යුගය විදු එළියෙන් බැබළවූ ප්‍රධානතම අධ්‍යාපන ආයතනය විය. දක්ෂිණ ලංකාවෙහි තොටගම ගමෙහි වූ තොටගම වෙහෙරෙහි මහා විජයබාහු රජු විසින් ඇරඹුණු පිරිවෙන විජයබාහු පිරිවෙන නමින් හැඳින්විණි. මෙය ආරම්භ කෙරුණේ කෝට්ටේ යුගයෙහි නොවේ. කුරුණෑගල යුගයේ විසූ මහා විජයබාහු නොහොත් විජයබාහු රජු විසිනි. ඒ බව තොටගමු වෙහෙර පිළිබඳව මහා වංශයෙහි වන තොරතුරු සාක්ෂ්‍ය දරයි. නොයෙක් සන්දේශ කාව්‍යයන්හි තොටගමුවේ විජයබාහු පිරිවෙන පිළිබඳව ද, ශ්‍රී රාහුල මහා හිමියන් පිළිබඳව ද සඳහන් ය. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව සඳහන් වන පළමුවැනි සන්දේශ තිසරය යි. කොවුල් සඳෙසෙහි තොටගමු පිරුවන් වෙහෙරෙහි වන නාථ දෙවියන්ගේ පිළිමය "ඉතා ගන නිල් පිළිමය" "පොරණ ලකුණු යුතු දාගැබ" පිළිබඳව ද සඳහන් වේ. එම යුගයෙහි සමාජයෙහි පැවති දැඩි දේව විශ්වාසය මෙයින් පැහැදිලි වේ. ගිරා සඳෙස තොටගමුවේ වෙහෙර ගැන ද, පිරුවන ගැන ද විසිතුරු වර්ණනා කරයි. එය අබිදහම, විනය, වේදාර්ථ, ග්‍රහ, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය, වියරණ ය අර්ථ ශාස්ත්‍රය හෙවත් නීති ශාස්ත්‍රය, ඡන්දාලංකාර, සංස්කෘත, මාගධ, සිංහල, දෙමළ, කාව්‍ය, නාටක ආදී විෂයයන් එහි ඉගැන්විණි. මේ විෂය ධාරාව පිළිබිඹු කරන්නේ එකල පැවති අධ්‍යාපන ක්‍රමයේ දේශිය, අනුරූප භාවයත්, විශිෂ්ටත්වයත් ය. එමඟින් බිහි කෙරුණේ සම්පූර්ණ පාණ්ඩිත්‍යයෙන් හෙබි ශිෂ්‍යයෝය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ස්වාමි ආදි ෂඩ්භාෂා පරමේශ්වරයෝ ය.

i. තොටගමුවේ විජයබා පිරිවෙන ආරම්භ කළ රජතුමා හා යුගය දක්වන්න.

ii. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් දක්වන්න.

iii. පිරිවෙනෙහි ඉගැන් වූ විෂයයන් දෙකක් ලියන්න.

iv. එවැනි විෂය ධාරාවකින් පිළිබිඹු කරන්නේ කිනම් කරුණු ද?

v. අර්ථ පහදන්න.

(අ) පොරණ (ආ) ෂඩ්භාෂා

(ලකුණු 2 x 5 =10)

05. රුක්මල්විල 'දිරිය' යෞවන සමාජය මගින් ප්‍රදේශයේ කාන්තා අභිවෘද්ධිය අරමුණ කොට ගත් පන් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පුහුණු ශිල්පීන්ගේ මග පෙන්වීම යොදා ගැනීමට බලාපොරොත්තු වේ. දේශීය පන් වගාවට නම් දරා ඇති මෙම ප්‍රදේශයේ මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට වඩා පහසුවක් වන අතර එමගින් අමතර අදායමක් උපයා ගැනීමට හැකි වනු ඇත. මෙම වැඩමුළුව 2023.04.20 වන දින පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා රුක්මල්විල ප්‍රජා ශාලාවේදී පැවැත්වීමට නියමිත ය. මේ පිළිබඳ ව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

මේ සඳහා වචන 100 ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

නැතහොත්

ඔබ සත්සිරිපුර දකුණ ග්‍රාම නිලධාරී යැයි සිතන්න. පසුගිය දින ගණනක් මුළුල්ලේ ඇද හැළුණු ධාරාණිපාත වර්ෂාවෙන් වීරගම ඔය පිටාර ගැලීම නිසා පොදු ජන ජීවිතයට විශාල වශයෙන් හානි පැමිණ ඇත. වාසස්ථාන, පානිය ජලය, ආහාර ද්‍රව්‍ය, ඇඳුම් වැනි මූලික අවශ්‍යතාවන් සඳහා ගැටලු සහගත තත්ත්වයක් උද්ගතව ඇත. මෙය මග හරවා ගැනීමට සහයෝගය පතමින් කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.

(ලකුණු 15)

**

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## 2022 - පෙරහුරු පරීක්ෂණය
## 11 ශ්‍රේණිය - අ.පො.ස.(සා.පෙළ) විභාගය
## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**සැලකිය යුතුයි:**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.** කාලය : පැය 02 යි.

**(4) (I) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් ගසන්න.**

(I) "ඔව්, ඔයාට ඒක තේරුණේ නෑ නේද? ආයි ඇරලා නෑ දෙකම එක වගේමයි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරකු ද?
(ආ) මෙම කොටස උපුටා ගත් කෙටි කතාවේ පරිවර්තකයා කවුද?

(II) "ඔබ පා මුල හිඳුවා මා වැඩෙන වයසෙ දී"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.
(ආ) මෙම කොටස උපුටා ගත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(III) (අ) අඟුල්මල් දමනය ඇතුළත්වන මුල් කෘතිය කුමක් ද?
(ආ) එය රචනා වූ අවධිය නම් කරන්න.

(IV) ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ

(අ) මෙම පද්‍ය පන්තිය රචනා කළේ කා විසින් ද?
(ආ) රචකයාගේ වෙනත් කාව්‍ය නිර්මාණයක් ලියන්න.

(V) "තාත්තා එනවා දැකලා බන්නවන්න කතා කළා නේද?

(අ) මෙහි සඳහන්වන තාත්තාගේ නම කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළ තැනැත්තා කවුද?

(VI) "අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳ ගෙන රජ හස පුල් විලේයා "

(අ) මෙම කවිය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙහි දෙවන පදයේ අර්ථය ලියන්න.

(VII) "......................................................
......................................................
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහි වන විට පුංචි පුතුන්"

(අ) මෙහි මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මේ පද්‍යයට අනුව කවියාට සතුටක් දැනෙන්නේ ඇයි?

(VIII) (අ) සතර කන් මන්ත්‍රණය පාඩම අයත් ජාතක කතාව කුමක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත ඇසුරෙන් රචිත පරිවාර ග්‍රන්ථයක් ලියන්න.

(IX) රන් තරු පිරිවරා ගත් සඳ මඬල යට
මහ වන බිමක් මැද ගිරි කුළු අතර සිට
නොමියන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරමි කෙදිරියක් මුළු ලොව නිසල කොට

(අ) මෙම පද්‍ය පන්තිය රචනා කළේ කවුරුන් විසින් ද?
(ආ) ඔහු ලියූ කාව්‍ය ග්‍රන්ථයක නම ලියන්න.

(X) පහත සඳහන් කෘතිවල රචකයන් නම් කරන්න.

(අ) ධර්ම ප්‍රදීපිකාව
(ආ) මනෝමන්දිර

(ලකුණු 2x10=20)

**(2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(I) "සොර ක්ලාන්ත වී යැ මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සී"

(අ) මෙම පාඨයේ අර්ථය කුමක් ද?
(ආ) මෙය උපුටා ගත් ග්‍රන්ථය හා එහි සඳහන් බුදු ගුණය නම් කරන්න.

(II) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගහටත් හෙණ නොවදිද්ද

(අ) මෙම කවියේ හතරවන පදයෙන් කියවෙන සත්ත්ව ජීවිතය හා සම්බන්ධ දහම කුමක් ද?
(ආ) සමස්ත කවියේ සරළ අර්ථය කුමක් ද?

(III) "විෂබීජ හා **<u>ක්ෂුද්‍ර ප්‍රාණීන්</u>** පිළිබඳව ද මෙහි දී උගන්වනු ලැබිණ. ඒ අනුව ඇතැම් ලෙඩ රෝග සෑදුණේ ඔවුන්ගෙනි. මෙය මෙතෙක් මා සිතා සිටි **<u>රෝග නිදානවලට</u>** වඩා වෙනස් විය."

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙම ප්‍රකාශය කරන පුද්ගලයා විසින් මෙතෙක් විශ්වාස කරන ලද රෝග නිදානවලට හේතු මොනවා ද?

(IV) එමා සත්හු වෙණ නද අසමානය
සමා නො වෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය
දමා එයින් වින්දෝ අවමානය

(අ) මෙහි සඳහන් පරිදි මානයෙන් යුත්තෝ කවුද?
(ආ) ඔවුන්ගේ මානය හැර දැමීමට හේතුව කුමක් ?

(V) "ඔව් ඔව්, ඒ මැරුණේ අපේ අප්පච්චි"
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවුද
(ආ) කුමන අවස්ථාවේ ද?

(3) උග්ගසේන සිටු පුත්හුගේ කථා වස්තුවේ,
(ii) ලේඛකයාගේ කථා කලාවේ විශේෂත්වයත්,
(iii) අවස්ථා හා සිද්ධි නිරූපයත් අපූර්වට දක්වා ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්,**
(i) අර්ථ රසයත්,
(ii) ශබ්ද රසයත් මැනවින් යොදාගෙන ඇති ආකාරය හංස සන්දේශයෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(4) (i) සිහින ලෝකයක අතරමං වී කාලය ගත කරන මැටිල්ඩාගේ චරිතයත්,

(ii) පවුල් ජීවිය ආරක්ෂා කර ගැනීමට ඉවසීමෙන් හා කැපවීමෙන් කටයුතු කරන සැමියෙකුගේ චරිතයත් දියමන්ති මාලය කෙටි කතාව ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්,**

(i) හේන් ගොවිතැන් කටයුතු සිදු කරන ආකාරයත්,

(ii) ගොවිතැනේ දී ගොවියා මුහුණ දෙන අභියෝගත් ජයගන්නා ආකාරය කුරහන් ඉසිමුව කළුවර බලාලා කවි පන්තියෙන් නිරූපණය වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පහදන්න.

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

(5) යෝග්‍ය භාෂා භාවිතය උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය උදාහරණ තුනක් දෙමින් විස්තර කරන්න.

(6) දැතේ කරගැට සිඹ සනසන්නට පද්‍ය පන්තිය තුළින් අතීත ශ්‍රී විභූතිය නිරූපණය වන ආකාරය උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

(7) තාරුණ්‍යයේ පසුවන සිංහබාහුගේ චරිතයෙන් පිළිබිඹුවන ලක්ෂණ උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න.

***